## පුංචි ඔබට සිතන්න දෙයක්

### දුවේ පුතේ මේ කතාව ඔබටයි !

මේ ඇමරිකාවේ නිව්යෝක් නුවරයි.

ඒ ලස්සන සංගීත සැන්දෑවේ ආරම්භයට මුළු ශාලාවම අතුරු සිදුරු නැතිව පිරී තිබුණි. ප්‍රධාන ආරාධිතයා වුයේ මෝර්ටල් කියන ප්‍රසිද්ධ වෛද්‍යවරයා. ඔහුත් හොඳ සංගීත ලෝලියෙක්.

සංගීතය ඇරඹුණි. ඒ විශාල පියානෝව ඉදිරියේ ලස්සන හුරුබුහුටි දැරියක් ඇඟිලි තුඩු රිද්මයට යවමින් වාදනයේ යෙදී සිටියාය. ඇගේ මිහිරි ගායනය නරඹන්නන් වශී කළා. අල්පෙනෙත්තක් වැටෙන හඬක් ඇසෙන තරමටම මුළු ශාලාවම නිහඬව දෑස් දල්වා බලා සිටියා. රැස්ව සිටි පිරිස ගල් ගැසුණාක් මෙන් ඇගේ මිහිරි ගායනය හා වාදනය අසා සිටියහ.

සංගීතය අවසන් වුණි.

නරඹන්නෝ සතුට ප්‍රකාශ කරමින් කන් බිහිරි කරවන ලෙසින් අත්පොළසන් දුන්හ. ගායනයෙහි හා වාදනයෙහි යෙදුණු ඒ දැරිය වාඩි වී සිටි අසුනේම සිටිමින් නරඹන්නන්ට ආචාර කළාය.

ප්‍රධාන ආරාධිත දොස්තර මෝර්ටල්ට හරි සතුටුයි. මේ තරම් දක්ෂ දැරියක් ! ඇයව දැක ගන්නට ඔහුට කුතුහලයක් ඔහුට ඇතිවුණි. "මම ඔබව දකින්න ආසයි !" පුංචි කොළ කැබැල්ලක් ලියා ඔහු කෙනෙකු අත යැවීය. "සමාවෙන්න, උපතින්ම වු ආබාධයක් නිසා මට ඔබ වෙත ඒමට නොහැකියි," ඈ ලියා එවා තිබුණාය.

දොස්තර මහතා ඈ ළගට ගියේය. ඔහු ඇයට උණුසුම් ලෙස සුභ පැතුවේය. "දුවේ, ඔබ සැබෑම දක්ෂයි ! ඔබේ නම කුමක්ද ?"

" මම පෙට්‍රනෙලා!"

"පෙට්‍රනෙලා ? ...... ඔබ ඉපදුනේ සෙන්ට්‍රල් රෝහලේද ?"
"ඔව් " දැරිවිය උත්තර දුන්නාය.

මෝර්ටල් දොස්තර මහතාගේ සිත අවුරුදු 22 ක අතීතයට දුවගියා. එදා වාට්ටුව භාර ප්‍රධාන වෛද්‍යවරයා නිවාඩු ගොසින් සිටි හෙයින් දරූ ප්‍රසුතිය සඳහා වු සැත්කමක් කරන්නට වුයේ තරුණ මෝර්ටල් දොස්තර මහතාටයි. .... සැත්කම සාර්ථක වුණා. දරුවා බිහිවුණා. ලස්සන ගැහැණු දරුවෙක් ! නමුත්, ඇගේ පාද දෙකම විකෘතිව ආබාධිතව පිහිටා තිබුණා. තරුණ වෛද්‍යවරයාට හරිම දුකයි. තමන්ගේ පළමුවෙනි සැත්කමේදීම මේ වාගේ අත්දැකීමක් ! අනේ ! මේ දරුවා දෙමාපියන-"ට බරක් වේවි. මේ දරුවාට සමාජයේ මොන වගේ තැනක් ලැබේවිද ? මෝර්ටල් වෛද්‍යවරයා ඉතා කනගාටුවට පත්වුණා.

අවුරුදු 22 කට පසුව ඒ දැරිය දැන් වෛද්‍යවරයා ඉදිරියේ. ඒ ඇවිද්න්න බැරි ආබාධිත දරුවෙක් ලෙස නම් නොවෙයි. මුළු රටක්ම ආදරය කරන ගායනයෙහි හා වාදනයෙහි දක්ෂ ශිල්පිනියක් ලෙසයි.

දුවේ පුතේ මේ අහන්න,
බලන්න පෙට්‍රනෙලා දෙස. ආබාධිත පාද ගැන දුක් නොවි ලැබුණු දක්ෂතාවලින් ඈ ප්‍රයෝජනයක් ගත්තාය. ඒවා දියුණු කර ගත්තාය. ඔබත් විවිධ දක්ෂතාවලින් පිරිපුන් අය. කළයුත්තේ ඔබ තුළ ඇති සැඟවුණු කුසලතා හඳුනාගෙන ඒවා තමන්ටත් අන් අයටත් ප්‍රයෝජනයක් වන ලෙස වැඩි වර්ධනය කර ගැනීමය.

ඔබට ජය !

**ප්‍රසාදිනි වෙත්තසිංහ නැන්දා**

## මගේ උපන්දින උත්සවය

නිවාඩු කාලයේදී ජූලි 4 වැනිදා මම මගේ උපන් දිනය සැමරුවා. උදේ වරුවේ යාලුවෝ තුන් දෙනෙක් හවස උපන්දින සාදයට කෑම සෑදීමට සහ ගෙය සැරසීමට උදව් වෙන්න ආවා. අපි රෙඩ් වෙල්වට් කප් කේක් සහ කේක් පොප්ස් සෑදුවා. අපි ගෙය බැලුම් වලින් සැරසුවා.

උපන්දින උත්සවයට අපි හැමෝම ගවුම් ඇන්දාය. පහ වෙනකොට මගෙ යාළුවො ආවා. මට එයාලගෙන් ලස්සන තෑගි හම්බවුණා. අපි හැමෝ ම කාලා බීලා හොඳට සතුටු වුණා. මගේ යාළුවෙකුගෙ අම්මා කෙනෙක් ලස්සන කේක් එකක් සැදුවා. එය ලස්සනට සරසලා තිබුණා. නමය වෙනකොට මගේ යාළුවන්ගේ අම්මලා තාත්තලා ඇවිත් එයාලව ගෙදර රැගෙන ගියා.

**මල්ෂි ගම්ලත්**
7/8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල
රොක්ස්බර්ග් පාක්

## ගාල්ල



ගාල්ල යනු ශ්‍රී ලංකාවේ දකුණාලු පළාතේ පිහිටි අගනගරයයි. එය වර්ග සැතපුම් 6.5 ක් පුරා පැතිර පවතී. ගාල්ල නගරය සතුව ඓතිහාසික ස්ථාන කිහිපයක් පවතී. එයින් එකක් වන්නේ ගාලු කොටුවයි. මෙය පෘතුගීසීන් විසින් ක්‍රි.ව 1505 දී ලංකාව ආක්‍රමණයෙන් පසුව ෂතුරු කරදර වලින් ආරක්ෂා වීම සඳහා සාදවන ලද බලකොටුවකි. පසුව 17 වන සියවසේදී ලන්දේසීන්බ විසින් නවීකරණය කරන ලද අතර මේ වන විට එය අවුරුදු 400 ක අතීතයකට හිමිකම් කියයි. පෘතුග්‍රීසින්ගෙන් අපිට උරුම වූ ලෝක උරුමයක් ලෙස හඳුන්-වන ගාලු කොටුව සුන්දර මෙන්ම ඉපැරණි ස්ානයකි.

ගාල්ල පුරාණයේ සිටම වෙළඩ' නගරයක් ලෙස ප්‍රසිස්ධව පවතී. ගාලු වරාය සුවිශේෂී වරායක් ලෙස සුප්‍රකටය. මීට අමතරව රූමස්සල කන්ද, ගාල්ලේ සුවිශේෂීත්වය තවත් වැඩි කරයි.

ගාල්ල නගරයෙන් බිහිවූ උගතුන් අතර මාර්ටින් වික්‍රමසිංහ යන ලෝක ප්‍රසිද්ධ ලේඛකයා හා සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නංගර.. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ පියා.. වැනි උගතුන් ප්‍රමුඛ වේ. ගාල්ල මාර්ගයේදී ඔබට හමුවන බෙන්තර ගල්පාත විහාරය, අලුත්ගම කන්දේ විහාරය, කොස්ගොඩ කැස් බෑ අභිජනන මධ්‍යස්ථානය, අම්බලන්ගොඩ වෙස්මුණු කර්මාන්තය, හික්කඩු කොරල් උයන සහ සීනිගම දේවාලය ආදී ස්ථාන සිත් ඇඳ බැඳ ගන්නා සුළුය. මේ සෑම දෙනාගේ නෙත් සිත් මවිත කරයි.

**නෙත්මිණී ජයසූරිය**
8 ශ්‍රේණිය

## ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයෙන් වටවූ පුංචි දූපතකි. ශ්‍රී ලංකාවේ අගනුවර වන්නේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේයි. වාණිජ නගරය වන්නේ කොළඹයි. ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් ජාතිකයෝ ජීවත් වෙති. ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපල පිහිටා ඇත්තේ කටුණායකය.

ශ්‍රී ලංකාවෙන් තේ, රබර්,පොල් ලහා මැණික් පිටරට යවනවා. ලංකාවේ මැද කදුකරයක් පිහි-ටා තිබෙනවා. ලංකාවේ උසම කන්ද පිදුරුතලාගල කන්දය. මේ කදු වලින් ගංගා මුහුදට ගලා බසිනවා. ලංකාවේ දිගම ගඟ මහවැලි ගඟයි. ශ්‍රී ලංකාවේ ලස්සන දියඇලි බො-හෝ ඇත. දියළුම, දුන්හිද, හා බඹරකන්ද යන දියඇලි මේ අතරින් කිහිපයකි.

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වලි කුකුළාය. ලංකාවේ ජාතික පුෂ්පය නිල් මානෙල් මලයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික ක්‍රීඩාව වොලිබෝල්ය. ලංකාවට ආසන්නව රට ඉන්දියාවයි. ශ්‍රී ලංකාව හරිම ලස්සන රටකි. ශ්‍රී ලංකාව මගේ රටයි.

**කවීෂා දංවත්ත ලියනගේ**
7/8 පන්තිය
සිංහල භාෂා පාසල රොක්-ස්බර්ග් පාක්

## මගේ තාත්තා

මගේ තාත්තාගේ නම ඔව්ද විපුලගුණ. ඔහුට වයස අවුරුදු හතලිස් හතරක් වේ. තාත්තා ඉපදුනේ ලංකාවේ මාතර දිස්ත්‍රික්කයේ වෙලේගොඩ ප්‍රදේශයේ ය. ඔහු පවුලේ වැඩිමලා ය. ඔහුට බාල නංගිලා හතරදෙනෙක් සිටිනවා. තාත්තා දැන් ජීවත්වන්නේ මාත් අම්මාත් සමග මෙල්බර්න් නුවර ය.

මගේ තාත්තා වෛද්‍යවරයෙකි. ඔහු ලංකාවේ මාතර රාහුල විදුහලේ ඉගෙනගත් පසු කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍යවරයකුවීමට ඉගෙන ගත්තේය. වසර නවයක් වෛද්‍යවරයකු ලෙස ලංකාවේ සේවය කළ පසු ඕස්ට්‍රේලියාවට ඇවිත් විභාග වලින් සමත්ව තාත්තා නැවත මෙහි වෛද්‍යවරයකු වුණේය.

මගේ තාත්තා ඔහුගේ පවුලට ගොඩක් ආදරෙයි. තාත්තා මට ඉල්ලන ඕනෙම දෙයක් අරන් දෙයි. ඔහු මටත් අම්මාටත් හොඳට ඇහුම්කන් දෙයි. තාත්තා තදින් ආදරය පෙන්වන්නේ නැතිවුනත් ඔහු ඔහුගේ මුලු පවුලටම බොහෙ-ෝම ආදරෙයි. මම පොඩිකාලේ ඉඳන් තාත්තා මට පොත් කියවන්නට ඉගැන්නුවේය. දැනුත් මගේ වැඩ වලට ගොඩක් උදවුවෙයි.

මගේ තාත්තා හරිම හොඳයි. ඔහු වැඩිපුර කතා නොකරයි. කතාවෙනුත් වැඩ වලිනුත් තාත්තා හරිම දක්ෂයි. තාත්තා මටත් අම්මාටත් බොහෝම ආදරෙයි. මමත් තාත්තාට බොහෝම ආදරෙයි.

**නිසල් විපුලගුණ**
7/8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල
රොක්ස්බර්ග්පාක්

## අත්තම්මා පැමිණියදා

එදා මම පාසල නිම වී නිවසට පැමිණියේ මහත් හිසරදයකින් පීඩා විඳිමිනි. සුපුරුදු පරිදි නිවස තුලට ඇතුළු වූ මට දැනුනේ විශාල අමුත්තකි. රස කෑම සුවඳක්ද හුරුපුරුදු කටහඩක්ද අතරේ මම කුස්සියට එබී බැලුවෙමි. ගමේ අත්තම්මා, අම්මා සමඟ සතුටු සාමිචියේ යෙදී සිටියාය. දැඩි කොහි ගියාදැයි මටම නොතේරුණි. පොත් බෑගය පැත්තකට තැබූ මම අත්තම්මා වැළඳ ගත්තේ ඉමහත් සතුටිනි. මම අත්තම්මා ඇඳගෙන මගේ කාමරයට ගියෙමි. ඇඳට බරවූ අත්තම්මාගෙන් ගමේ තොරතුරු දැන ගන්නා තුරු මම නොවිසිල්ලෙන් සිටියෙමි. ඒ සමඟ පැමිණි අම්මා , දහවල් කෑම සඳහා එන්නැයි කී නිසා ගමේ විස්තර කතා බහ මඳකට කල්දැමූ මමත්, අත්තම්මාත්, අම්මාත් එක්වී රැකෑම කෑවෙමු.

අත්තම්මා පැමිණි දිනට අපේ ගෙදර මඟුල් ගෙයක් වාගෙයි. කෑම8 ජාති ඕනෑ තරම් ඇත. වැලි තලප හා මුං කැවුම් කෑමට අපේ ගෙදර අය කැමති බව දන්නා නිසාම ඇය ඒවා සාදාගෙන ඒමට අමතක නොකරයි. සවසට මල් කඩා බුදුන් වදින අත්තම්මාත්, මමත් ඉන් පසුව කරන්නේ මිදුලේ ලෑලි බංකුව මතට වී රස කතා කීමයි. දත් නැති කට පෙන්වා සිනාසෙන මගේ අත්තම්මාගේ සුන්දරත්වයට මම ඉතා ආශා කරමි. ඈ ඉතා කරුණාවන්තය. ඈ අප නිවසේ සිටින විට කාලය ගත වෙනවා නොතේරෙයිත මගේ අත්තම්මාට මගේ ළඟටම වී සිටින්නට හැකි නම් කියා මට සිතුණු වාර ගණන අනන්තය.

**හිරුෂි පෙරේරා**
7/8 ශ්‍රේණිය
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්

## ඕස්ට්‍රේලියා දිනය

ජනවාරි 26 වෙනිදා වසරක් පාසාම අපි ඕස්ට්‍රේලියා දිනය සමරනවා. ඕස්ට්‍රේලියා දිනය, රජයේ නිවාඩු දිනයකි. ඕස්ට්‍රේලියාවේ සෑම ප්‍රාන්තයකම සහ දේශසීමාවකම මෙය සමරනවා. මේ දිනයේදී , ලොකු සහ පොඩි ජනවර්ග සියල්ලම ඕස්ට්‍රේලියාවේ ශ්‍රේෂ්ඨතම සහ ඕස්ට්‍රේලියානුවෙකු වීමේ ප්‍රීතිය සමරනවා.
මේ දිනය අපි අපේ ඉතිහාසයත්,මේ රටට සේවය කළ සියලු දෙනා වෙනුවෙන් ගෞරව කිරීමටත් යොදා ගන්නවා.ඕස්ට්‍රේලියා දිනය කියන්නේ වර්තමානයේ සතුටු වෙන හා සශ්‍රික අනාගතයක් ගොඩනගා ගැනීම වෙනුවෙන් කැපවෙන දිනයයි. මේ හේතුව නිසා මේ දවසේ රට වටා බො-හෝ පුරවැසි උත්සව සැමරෙනවා.

ජනවාරි 26 දිනය මහා බ්‍රිතාන්‍ය පළවෙනි බණ්ඩය ඕස්ට්‍රේලියාවට පැමිණීමේ සංවත්සර දිනයයි. ඔවුන් 1788 දී පැමිණියේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ සිරකරුවන් පිරිසක් මෙහි පදිංචි කරවීමටයි. පළවෙනි බණ්ඩයේ අණදෙන නිළධාරියාගේ නම කපිතාන් ආතර් ෆිලිප්ය.

ඕස්ට්‍රේලියා දිනයට පෙර දවසේ ඕස්ට්‍රේලියාවේ අගමැති වසරේ ඕස්ට්‍රේලියානු සම්මානය නිවේදනය කරනවා . මේ කටයුත්ත සිදුවන්නේ කැන්බරා නගරයෙයි.
(ඔස්ට්‍රේලියානු පුරවැසි ප්‍රදාන ග්‍රන්ථයෙහි ඔස්ට්‍රේලියා දිනය පිළිබඳ සිංහල පරිවර්තනයකි.)

**දෙව්මි අබේසිරි ගුණවර්ධන**
8 වන වසර
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්




Look up above,
Tell me, what do you see?
Yellow flashes and emerald sashes,
Gathered together, ready to flee.

Red swirils just waiting,
To burst into flame,
Loud purple looking,
For someone to blame.

Pink little flutters,
Glimpses of white,
Blue, green and orange,
Mixed together just right.

The perfect concoction,
Of shades dark and bright,
The sky shows off its colours,
Ta warn of the night...

**Dewmini Abeysirigunawardane**
Grade 8
Essendon Grammer School
Penleigh and Moonipond Campus